**UNIVERSITY OF PERADENIYA**
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2017 අප්‍රේල්
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) APRIL 2017

BPHE 102: ආදි බෞද්ධ දර්ශනය

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. "බුදුසමයෙහි උදාව භාරතීය චින්තන ඉතිහාසය තුළ දාර්ශනික විප්ලවයක් සනිටුහන් කරයි." පරීක්ෂා කරන්න.

2. බුදුසමය හුදෙක් ආගමක් ලෙස හෝ දර්ශනයක් ලෙස හෝ අධ්‍යයනය කිරීම කොතරම් දුරකට සාධාරණ වේදැයි පරීක්ෂාකරන්න.

3. ප්‍රාග්-බෞද්ධ භාරතීය දාර්ශනික පද්ධති බුදුන් වහන්සේ විවේචනයට භාජනය කළේ කෙබඳු පදනම් මත ද?

4. සත්‍යය පිළිබඳ ඉදිරිපත් කර ඇති අනෙකුත් දාර්ශනික ප්‍රවාද සමඟ තුලනය කිරීමේ දී බුදුසමයෙහි එන ඉගැන්වීම් කුමන ස්ථාවරයක් ගන්නේදැයි පැහැදිලි කරන්න.

5. නියතිවාදය හා ස්වච්ඡන්දතාව අතර පවතින ගැටලුව නිරාකරණය සඳහා බෞද්ධ විසඳුම සාකච්ඡා කරන්න.

6. කය හා මනස අතර සබඳතාව පටිච්චසමුප්පන්න ක්‍රියාවලියක් ලෙස බුදුසමය හඳුනා ගන්නා ආකාරය පහදන්න.

අනෙක් පිටුවට ...

7. දර්ශන ඉතිහාසයේ හේතුඵල සම්බන්ධතාවෙහි ස්වභාවය පිළිබඳව වූ ප්‍රධාන වාද පරීක්ෂා කරමින් හේතුඵලභාවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරන්න.

8. "ථේරවාද බුදුදහමෙහි ඉගැන්වෙන අනිත්‍යතාව ආනුභවික වූ ධර්මයකි." සාකච්ඡා කරන්න.

9. ඇතැම් දාර්ශනික ප්‍රශ්න බුදුසමයෙහි අව්‍යාකත වශයෙන් හැඳින්වීම හේතුකොට ගෙන බුදුසමය සංශයවාදයක් බවට පත් වෙතැයි යන මතය පිළිගත හැකිද?

10. ආදි බුදුසමයේ සඳහන් නිබ්බාණ සංකල්පය පිළිබඳව මතුවන දාර්ශනික ගැටලු කවරේද?

==========